| | |
|---|---|
| 0.00 - 1.00 | **ඉපදුනේ කොහේද ?**<br><br>අවිස්සාවේල්ලේ<br><br>**අවිස්සාවේල්ලේ?**<br><br>අවිස්සාවේල්ලේ දැරණියගල<br><br>**දැරණියාගල . හා......ඇයි.... කොහොමද මෙහොට ආවේ ?**<br><br>මෙහාට ආවා කියන්නේ අම්මලා තාත්තලා පොඩි දවස්වල වගේ ඒ පැත්තේ ඉදලා මේ පැත්තට ආවා. මම ඊට ඉස්සෙල්ලා හිටියේ..... ඒ දවස්වල හිටියේ කොළඹ බංගලාවක.<br><br>**කොහේද?**<br><br>දෙහිවල<br><br>**දෙහිවල හා**<br><br>ඒ පැත්තේ හිටියේ. අවුරුදු දහහතරක් පහලොවක්ම වෙනකම් එහේ හිටියේ. අවුරුදු නවයේ ඉදන්. ඊට පස්සේ මම ලොකු ළමයෙක් වුණාට පස්සේ තමයි අපේ තාත්තලා ඇවිල්ලා එතන මම යවන්න බැරියෙයි කිව්වා. ඊට පස්සේ ඒගොල්ලෝ බලෙන් තමයි මාව එක්කන් ආවේ. ඊට පස්සේ ඇවිල්ලා තමයි තැන් තැන්වල වතුවල හිටියේ.<br><br>**ඔයා කොච්චර වයස නවයේ ඉදලා කොයි....... නවය වයසේ ඉදලා කොයි.......**<br><br>අවුරුදු පහලොව වෙනකන් හිටියා.<br><br>**අවුරුදු පහලොව වෙනකන්... කොයි කාලෙද මොන අවුරුදුවලද?**<br><br>මම ඉපදුනේ හැත්ත පහේ. හැත්ත පහේ තුන්වෙනි මාසේ පහලොව.<br><br>**ආ....හා.......**<br><br>ඊට පස්සේ තමයි මම කොළඹ. අවුරුදු නවයේ වගේ තමයි මාව ගිහින් නැවැත්තුවේ |
| 1.00 - 2.00 | **තාත්තයි...... අම්මයි**<br><br>ඔව්. ඊට පස්සේ බලෙන් වගේ තාත්තා ඇවිල්ලා ආපහු එක්කන් ආවා. එක්කන් ආවාට පස්සේ ඊට පස්සේ...... මේ... ගෙදර ඉදගෙන වත්තේ වැඩ කර කර හිටියේ. ඊට පස්සේ බැදලා මම දැන් ඉන්නේ.<br><br>**බැන්දේ වත්තෙන්මද ?**<br><br>ඔව්<br><br>**වත්තෙම කවුරුහරිද නැත්නම් ?**<br><br>ඔව්<br><br>**අම්මයි තාත්තයි කැමැත්ත ඇතිවද ?**<br><br>ඔව් එගොල්ලෝ තමයි බන්දලා දුන්නේ.<br><br>**නැත්නම් යාලු වෙලාද?**<br><br>නෑ. අම්මලා තාත්තලා කැමැත්තෙන් තමයි බන්දලා දුන්නේ. |

| | |
|---|---|
| | **බන්දලා දුන්නේ හා ඔයාගේ මහත්තයා තාම ඉන්නවද මෙහේ ? එයත් වත්තෙමද වැඩ කරන්නේ ?**<br><br>ඔව්. වත්තේ වැඩ කරන්නේ. දලු අරන් ගියා දැන් මෙහේ පැට්ටේරියට.<br><br>**ආ දලු අරන් ගියා දැන් ......අවුරුදු නවය කොහෙද ගෙදර වැඩකටද යන්නේ ?**<br><br>ඔව් බංගලාවේ වැඩට.<br><br>**ඉතින් එතකොට ළමයි ඉන්නවද ඔයාට ?**<br><br>ළමයි තුන්දෙනෙක් ඉන්නවා.<br><br>**වයසවල් මොනවද ?**<br><br>ලොකු ළමයා ලොකු පුතාට අවුරුදු විසි එකක් වෙනවා. එයා දැන් ඉන්නේ මේ... වැලිගම. හාඩ්වෙයාර් එකක වැඩ කරන්නේ. අනිත් පුතා අවුරුදු දාසයයි. එයා මාත් එක්ක ගෙදර ඉන්නේ. පොඩිම එක්කෙනාට අවුරුදු එකොලහක්. සිකුරාදා දාසය වෙනිදට තමයි අවුරුදු එකොළහ ලබන්නේ. |
| 2.00 - 3.00 | **ඇත්තට? මේ... ඉතින් ඒගොල්ලෝ ඉස්කෝලේ යනවද ?**<br><br>ඔව්<br><br>**ඔක්කොමලා ඉස්කෝලේ ගියා ද හොදට ?**<br><br>ඔව්<br><br>**අපි අර එක්කෙනෙක් දෙන්නෙක් එක්ක කතා කලා පොඩි ළමයි එගොල්ලෝ ඉස්කෝලේ යන්නේ නෑ කියලා ඇයි දන්නේ නෑ ඒ ?**<br><br>ඔක්කෝම ළමයි ඉස්කෝලේ යන ළමයි තමයි ඉන්නේ. මේ... දෙන්නෙක් එක්කෙනෙක් වගේ තමයි වත්තෙන් ඉස්කෝලේ යන්නේ නැත්තේ. අනිත් ළමයි සේරම ඉස්කෝලේ යනවා. ළමයි විසි ගාණක්ද කොහෙද යනවා ඉස්කෝලෙට. සිංහල තමයි ඉගෙන ගන්නේ.<br><br>**ඇයි දෙමළ ඉස්කෝල දෙමළ පන්ති නැද්ද ?**<br><br>දෙමළ ඉස්කෝල තියෙනවා. පොඩ්ඩක් දුරයි. එච්චර උගන්නන්නේ නෑ.<br><br>**දුරට යන්න ඕන?**<br><br>ඔව්. ඒ නිසා අපි ලේසියට තමයි සිංහල දා ගත්තේ. දැන් ඒගොල්ලන්ට දෙමළ වචන මොකක්වත් තේරෙන්නේ නෑ. දෙමළ අකුරක්වත් තේරෙන්නේ නෑ. ඔක්කොම සිංහල තමයි පුලුවන්. ළමයින්ට වුණත්.<br><br>**අයියෝ ඇත්තද ? ඒක...... ඒක ගැන මොකද හිතෙන්නේ ?**<br><br>අපිටත් ඉතින් දුකයි තමයි. මොකද කරන්නේ දෙමළ ඉස්කෝලෙකට දානවනම් දෙනියායේ දාන්න ඕන නැත්නම් මේ... සෙල්වකන්ද ඒ පැත්තට තමයි දාන්න තියෙන්නේ. ඒක හින්ද තමයි අපේ ළමයි ඉස්කෝලේට දාගෙන සිංහල ඉස්කෝලෙට. |
| 3.0 - 4.0 | **ඉතින් මෙහොට දෙමළෙන් පන්ති වගේ තිබ්බොත් ?**<br><br>නෑ<br><br>**කවුරුහරි ඇවිල්ලා පන්තියක් එහෙම දැම්මොත් ?**<br><br>එහෙම කරොත් ඉතින් අපිත් කැමතියි දාන්න ළමයි. |

| | |
|---|---|
| | **ඔව්.... දෙමළ අකුරුවත් ඉගෙනගන්න නේද නැත්නම් අපරාදෙනේ ?**<br><br>ඔව් දැන් එක්කෙනෙයි ඉස්කෝලේ යන්ඩ ඉන්නෙ මගේ. එයාටත් දැන් කොහොම හරි දෙමළ ටිකක් උගන්නන්න ඔනේ කියලා..... මෙහේ කවුරුවක්වත් නෑ දෙමළ උගන්නන්න.<br><br>**එතකොට දැන් සාමාන්‍යයෙන් කතා කරන්නනේ..... ඔක්කොම කරන්නේ දෙමළෙන්ද සිංහලෙන් ද ?**<br><br>දෙමළෙනුත් කතා කරනවා. අපි වැඩිපුර සිංහලෙන් තමයි කතා කර ගන්නේ. ඇයි ඉතින් ළමයි සිංහලෙන්නේ ඉගෙන ගන්නේ ඒක නිසා<br><br>**හා**<br><br>ගෙදරත් මේ... වැඩි වෙලාවට දෙමළෙන් කතා කරාට ඒගොල්ලන්ට තේරෙන්නෑ. අපි සිංහලෙන් තමයි කතා කරන්නේ. දෙමළෙන් කතා කරන්නේ නෑ වැඩිපුර.<br><br>**එතකොට නැති වෙලා යනවනේ භාෂාව ?**<br><br>භාෂාව ඉතින් ඒගොල්ලන්ටත් තේරෙනවා අපි ඉතින්.<br><br>**තේරෙනවා. එතකොට දැන් ඔයගොල්ලෝ ක්‍රිස්තියානි ද හින්දු ද ?**<br><br>හින්දු අපි<br><br>**එතකොට ඒ කෝවිලක් එහෙම ළග තියෙනව ද ?**<br><br>ඔව්<br><br>**ඒ ළග** |
| 4.0 - 5.0 | කෝවිලක් තියෙනවා කියන්නේ මේ..... මෙතන අඩාරදෙණිය එකක් තියනවා. ලොකුම කෝවිල දෙනියායේ තියෙනවා. ඒවට යනවා.<br><br>**ඉතින් ඒවට යන්න වෙලාව එහෙම තියෙනවා ?**<br><br>පූජාවක් වගේ එහෙම තියෙනවනම් එහෙම යනවා. නැත්නම් මෙතන කෝවිලේ පූජාව කරනවා අපි. මොකක්හරි භාරයක් වෙච්ච එකට මෙතන ළග කෝවිලක් තියෙනවා. ඒකට පූජාව දෙනවා අපි ගිහිල්ලා<br><br>**සාමාන්‍යයෙන් දවස මොනවගේද කීයට විතරද නැගිටින්නේ ?**<br><br>උදේට ඉතින් හතර හමාරට හතරට වගේ නැගිටිනවා. සමහර දවසට පහට නැගිටිනවා. දැන් ඉස්කෝලේ නැති නිසා ටිකක් පරක්කු වෙලා නැගිටිනවා.<br><br>**නැත්නම් ඒගොල්ලන්ට උයලා එහෙම යවන්න ඕනද ?**<br><br>ඒගොල්ලන්ට කෑම යවන්න ඕන.... ඉතිං ඒ නිසා.... ගෙදර වැඩ කරගන්න ඕන. උදේට කොච්චර වේලාසන නැගිට්ටත් වෙලාව මදි ඉතිං උදේට වැඩ කර ගන්න.<br><br>**මේ... උදව්වත් මොනවත් තියෙනවද ඔයාට?**<br><br>නෑ<br><br>**තනියමද ?**<br><br>ඔව්<br><br>**මහත්තයා උදව් කරනවද කෑම උයන්න?** |

| | |
|---|---|
| | එයත් ඉතින් මොනවහරි උයන වැඩ මොකක්හරි උදව්වක් කරනවා. ඉතින් අනිත් වැඩ සේරම මම කරගන්න ඕන. ඒගොල්ලන්ට පුතාලට කන්න උයලා ඒගොල්ලන්ට කෑම ලේස්ති කරන්න ඕන. මටත් කෑම ටික ලේස්ති කර ගන්න ඕන.<br><br>**සාමාන්‍යයෙන් ඔයා මේ... වතුවල ගිහිල්ලා කරන වැඩ ගැන පොඩ්ඩක් කියන්න පුලුවන්ද මොනවද කියලා ? මොනවද කරන්නේ ?**<br><br>දලු තමයි ඉතින් කඩන්නේ. |
| 5.0 - 6.0 | **කීයටද යන්නේ කියලා වගේ ඒ විස්තරේ කියන්න**<br><br>උදේ හතහමාරට පෙරට්ටුවෙන් ගියාට පස්සේ ආයේ දොලහට දලු කිරලා ගෙදර එනවා. ආයේ එකට ගියායින් පස්සේ මේ වෙලාවට තමයි ඉතිං ආපහු ගෙදර එන්නේ<br><br>**ඉතින් මේ... වත්තේ කොච්චර දුරට යන්න තියනවද දලු ?**<br><br>මෙතන ඉදලා පොඩ්ඩක් ආධාරදෙණිය ෆැක්ට්‍රිය ගාව පැත්තේ ටිකක් තියනවා දලු. තව සතියට දවස් තුනක් දෙකක් වගේ තමයි කැඩෙන්නේ. ඊට පස්සේ ඉතින් මෙහේ තමයි වත්තේ ඇතුලේ.<br><br>**එතකොට සතියට ආ ඊට පස්සේ වත්තේ ඇතුලේ.....? එතකොට ඉරිදා..... සෙනසුරාදා ඉරිදා වැඩ කරනවද ?**<br><br>වැඩ තිබුණොත් කරනවා. නැත්නම් මහත්තයලා ඉතින් සමහර දවසට දලු නැත්නම් නවත්තනවනේ.<br><br>**ඔව්.... එතකොට මොකද කරන්නේ දලු අඩු කාලෙට එහෙම මොනවද කරන්නේ? වෙන වැඩක් තියනවද? වෙන ස්වයං රැකියාවක් කරනවද?**<br><br>නෑ<br><br>**දැන් නමට කීයක් විතර ඕනේද කිලෝ?**<br><br>විසි පහක් ඕන<br><br>**විසි පහක්?**<br><br>ඔව්<br><br>**දැන් දලු නැති කාලේ?**<br><br>නැති කාලෙටත් ඒ ගාණ තමයි ඉල්ලන්නේ<br><br>**එතකොට කොහොමද කරන්නේ දැන් දලු නැති කාලෙට ?** |
| 6.0 - 7.0 | ඒත් ඉතින් මේ... විසි හතර විසි තුන ඒව කැඩුවම ඒවට ඉතින් වරු තමයි වැටෙන්නේ.<br><br>**දලු නැති කාලේ ?**<br><br>ඔව්. දැන් ගිය මාසෙටත් දලු විසි හතරටද කොහෙද වරු දාලා තියෙන්නේ<br><br>**දැන් දලු කාලෙට ඒගොල්ලන්ට කොහොමද දැන් වැඩිපුරම ගන්නවනේ දලු ඒකට කොහොමද ගාණ ගෙවන්නේ ?**<br><br>ඒකටත් ගෙවනවා<br><br>**ගාණ කීයද ?** |

| | |
|---|---|
| | ගාණක්නම් දාලා නෑ ඉතින් ඔක්කොම එකට හදලා තියන නිසා අපිට බලාගන්න බෑ ඉතින් කීයද දෙන්නේ කියලා. ඉතින් අර වැඩි දලුට මං ඇහුවම කිව්වා ගෙවනවයි කියලා.<br><br>**සාමාන්‍යයෙන් මාසෙක පඩිය එහෙම කොච්චරක් කියන්න කැමතිනම් කියන්න. නැත්නම්......**<br><br>පඩි ඉතින් වැඩ කරන විදියට ඇඩ්වාන්ස් අඩුවෙන් වගේ ගන්නවනම් පඩි ගන්න පුලුවන්. අර ලෝන් එහෙම අරගෙන තිබුණොත් පඩි ටිකක් අඩු වෙනවා.<br><br>**දවස පඩි කීයද ?**<br><br>හයසිය අසූවයි<br><br>**ඔගොල්ලන්ට දවස් විසිහතරම හම්බවෙනවද වැඩ ?**<br><br>ගිය මාසෙට විසි හතක් දීලා තියනවා විසි හතෙන් අපි ඉතින් අමතර අර ළමයි ලෙඩ වුණාම.... අපි ලෙඩ වුණාම.... ගෙදර ඉන්නවනේ. කොහොමහරි විසි පහක් විසි හතරක් කර ගන්නවා. |
| 7.00 - 8.00 | **විසි හතරකට වැඩියෙන් වැඩ කලාමත් ඔගොල්ලන්ට බෝනස් වගේ වැඩිපුරම ගාණක් ගෙවනවා නේද ඒක.... මේ... වත්තේ ගෙවනවද ඔගොල්ලන්ට ?**<br><br>බෝනස් දෙනවා.<br><br>**එතකොට සාමාන්‍යයෙන්.... ඒ කියන්නෙ...... මෙහේ වත්තක පහසුකම් මොනවද තියෙන්නේ ?**<br><br>පහසුකම් තියනවා. ඉතින් අඩුපාඩු ගොඩක් තියනවා.<br><br>**අඩුපාඩු මොනවගේ අඩුපාඩුද ?**<br><br>මොකක්ද ඉතින් අපිට මේ... වෙලාවට වතුර නැති වෙනවා නාන්න . ළිදක් තියනවා ඒකේ තමයි වත්තේ සේරම කට්ටිය නාන්න ඕන. වතුර යටට ගියාට පස්සේ ගන්න කොට බොර වෙනවා. බොර වුණාම යන්න ඕන අතන පාලම ළගට නාන්න.<br><br>**මෙහාට උඩට වතුර එන්නේ  නෑ ?**<br><br>නෑ<br><br>**පයිප්ප වතුර නෑ ?**<br><br>පයිප්ප තියනවා. ඒක ටැප් එක තියෙන්නේ බොන්න ගන්න විතරයි. බොන්න භාජන එහෙම හෝද ගන්න. පායන නිසා උදේට නවත්තලා ආයේ දොළහට අරිනවා. එකට වැහුවට පස්සේ ආයේ හතරට අරින්නේ. ආයේ පහමාර හය වෙන කොට ආයේ වහනවා. ආයේ උදේට තමයි |
| 8.00 - 9.00 | **මොනවද වතුර ?**<br><br>ඔව්. නැත්නම් දැන් පායන නිසා අරහේ වතුර නැති........<br><br>**නැති වෙන නිසා. ඒ නැති වෙන කාලෙට ද ඒ වහන්නේ ? නැත්තම්........**<br><br>ඔව්<br><br>**වතුර ප්‍රශ්නය. වෙන මොනවද ?**<br><br>වෙන ඉතින් අඩුපාඩු කියන්න නැහැ ඉතින් අපිට |

| | |
|---|---|
| | **වැසිකිලි පහසුකම් එහෙම ?**<br><br>තියෙනවා.<br><br>**ඒ කියන්නේ  ගෙවල්වලට තියනවද නැත්නම් ?**<br><br>පිටින් තියලා තියෙන්නෙ<br><br>**පිටින් තියලා තියෙන්නෙ?**<br><br>ඒ කියන්නේ පිටින් තියලා තියනවා එක ගෙදරකට එක ගානේ.<br><br>**එක් ගානේ හා හා**<br><br>එක කාමරේකට එක ටොයිලට් එක ගානේ දාලා තියෙන්නේ.<br><br>**ඒවා ඔක්කොම තමන් පහසුකම් තමන් සුද්ද කරගන්න ඕන ?**<br><br>ඔව් පිරිසිදු කරලා තියා ගන්න ඕන<br><br>**ඒක ඕගොල්ලන්ට මොනවහරි ආයතනයකින් හදලා දුන්න ද  එහෙම නැත්නම් ?**<br><br>ආයතනයෙන් එහෙන් හදලා දෙනවා අපිට.... දැන් අපිට කිව්වට පස්සේ අපිට මොකක්හරි තියනවා කියලා ඒගොල්ලෝ හදලා දෙනවා. |
| 9.00 - 10.00 | **එතකොට දැන් ළමයින්ට සනීප නැති වුණොත් එහෙම ඒවා ඒගොල්ලෝ ඉස්පිරිතාලේට එහෙම ගෙනියන්න පහසුකම් තියනවද ඒ කියන්නේ සෞඛ්‍ය පහසුකම්වලට මොනවද තියෙන්නේ ? එනවද කවුරුහරි බලන්න ?**<br><br>නෑ. ඉස්සරනම් මෙතන හොස්පිටල් එකක් තිබුනා මහත්තයෙක් එනවා හවසට. අපිට මේ වත්තෙන් තුණ්ඩු දෙනවා බොහෙත් ගන්න ගිහිල්ලා. ඒක වත්තට ගෙනත් දුන්නම මෙහෙන් ලියුමක් දෙනෝ ඒක වත්තට ගෙනත් දුන්නම වත්තෙන් කපා ගන්නවා. දැන්නම් ඒ පහසුකම නැහැ. දැන් යන්න ඕන  උඩේට ඉස්පිරිතාලෙට. මෙඩිකල් ෂොප් එකක් තිබුණා. ඒක දැන් වහලා.<br><br>**වහලා?**<br><br>දැන් මොකක්හරි ලෙඩක් දුකක් වුණොත් දෙනියායටම යන්න ඕන. නැත්නම් දෙනියාය ටවුමට ගිහින් ගන්න ඕන. නැත්නම් මහ ඉස්පිරිතාලේ යන්න තියෙන්න. රෑක ඉතින් අමාරුවක් වුණොත් ත්‍රී වීල් එකක් අරන් ගිහිල්ලා අපි නවත්තගෙන ඉන්න ඕන.<br><br>**සාමාන්‍යයෙන් ඕගොල්ලෝ කොච්චරකල් අවුරුද්දක් ද මේ වත්තේ පදිංචි වෙලා ඉන්නේ ?**<br><br>කලින්නම් ඇවිල්ලා අවුරුදු අටක් හිටියා. ඉදලා මං මේ... අපේ ලොකු පුතා පොඩි කරදරයක් වුණ නිසා ගිහිල්ලා මාස හයක් ඉදලා ආපහු මෙහාට ආවා. දැන් ලබන මාසේ දහහතර වෙනිදා ආවොත් අවුරුද්දක් වෙනවා. කලින් මම අවුරුදු අටක් හිටියා මෙහේ. |
| 10.0 - 11.0 | **ලොකු පුතාගේ මොකක්හරි.... මොකක්ද ප්‍රශ්නේ ?**<br><br>වත්තේ වැඩ කරලා ෆැක්ට්‍රිය යන්න කියලා.... ගියේ නැතුව ඒ මහත්තයාට කිව්වා වත්තෙන් යනවයි කියලා කිව්වා. මහත්තයා යන්නෙයි කිව්වේ නෑ. මෙයාට යන්න ඕනෙයි කියලා. ඊට පස්සේ මම ගිහිල්ලා මේ ළග තමයි හිටියේ. පස්සේ මට එතන ඉන්න බැරි වුණා. ඉන්න බෑ මෙහේ වගේ එතන හරි යන්නේ නැති නිසා මම ආපහු මෙහාටම ආවා. ඒ තියන ප්‍රශ්නේ ඉතින් අර මේ පෝය දවසට අපට නිදහසේ ගෙදර |

| | |
|---|---|
| | නැහැ. පෝයටත් ෆැක්ට්‍රි යන්න ඕන. පෝයට ෆැක්ට්‍රි ගියේ නැත්නම් ඊට පහුවෙනිදා වැඩත් නෑ.<br><br>**පෝයටත් යන්න ඕන ?**<br><br>ඔව්. ඉරිදා සෙනසුරාදා ඉරිදා දවසේ හදිසියේ දලු එහෙම නැති වුණොත් තමයි වැඩ නවත්තන්නේ. දලු තිබුණොත් වැඩ තියනවා. නැත්නම් අර පෝයට තමයි අපිට ප්‍රශ්නේ වැඩියෙන්ම තියෙන්නේ.<br><br>**ඉතින් ඒවගේ දේවල් ගැන ඒගොල්ලෝ එකතු වෙලා මොකක්හරි පියවරක් ගන්නව ද මහත්තයට කියලා ?** |
| 11.0 - 12.0 | කවුරුත් උනන්දු වෙන්නේ නැනේ ඒකට කතා කරන්න. කතා කරත් වැඩක් නෑ මිස් මෙහෙමනේ. කොච්චර කිව්වත් වැඩක් නෑ. එහෙම කතා කරන් පස්සේ කියන්නේ කැමතිනම් ඉන්නෙයි කියනෝ නැත්නම් යන්නෙයි කියලා තමයි කියන්නේ. අන්න ඒක තමයි. දැන් අපේ ගෙදර තුන්දෙනෙක් වැඩ කරනෝ. දැන් එක පොඩි එක්කෙනෙයි ඉන්නේ අවුරුදු දහයයි එකොළහක් වෙන්නේ. දැන් තුන් දෙනාම ගිහිල්ලා පහමාර වෙනවා ෆැක්ට්‍රි ඕෆ් වෙන්න. ගෙදර එනකොට හයට විතර වෙනවා. අපි ඇවිල්ලා නාන්නද ගෙදර වැඩ කරන්න ද ඊට පස්සේ කීයටද ඒගොල්ලන්ට උයලා කන්න දෙන්නේ.<br><br>**පෝය දවස්වලට දවස් එකහමාරක් පඩි දෙනවද ?**<br><br>පඩි එකහමාරක්. ඒ වුණත් නිදහසක් කියලා දෙයක් තියනවනේ. පෝය දවසටත් නිවාඩුවක් නැත්නම් වැඩක් නැනේ. අඩු ගාණේ දැන් ළමයි සිංහල ඉගෙන ගන්නේ ඒගොල්ලන්ව පන්සලකටවත් අපිට එක්කන් යන්න විධියක් නැහැනේ. වෙසක් පෝය දවසකටවත් එක්කන් යන්න විධියක් නෑ. ඒක තමයි අපිට තියෙන ලොකුම ගැටලුව මෙතන.<br><br>**නිවාඩුවක් නැති එක ?**<br><br>අමතර ඉතින් අපිට නිවාඩු දෙනවා. පෝය දවසට විතරක් ගෙදර ඉන්න බෑ.<br><br>**අනිත් සෙනසුරාදා ඉරිදා ?** |
| 12.0 - 13.0 | ඒවනම් නිවාඩු දෙනවා. සෙනසුරාදාට එහෙම වැඩ.<br><br>**වැඩ ?**<br><br>ඔව්. ඉරිදටත් සමහර දවස්වලට තමයි ඉරිදටත් වැඩ නවත්තන්නේ. ඒ කියන්නේ දලු ප්‍රශ්නේ තමයි. දලු එහෙම තියනවනම් වැඩ තියනවා. දලු අඩුයිනම් වැඩ නවත්තනවා. දැන් ගිය ඉරිදා දලු නැති නිසා දවස් තුනක් පිට පිට නෙලන්න දැම්මා. ඊට පස්සේ ඉරිදා නැවැත්තුවා.<br><br>**එතකොට එහෙම දැන් රෙදි එහෙම හෝද ගන්න වෙලාව කොහෙද තියෙන්නේ ?**<br><br>ඔක්කොම අර ළිදේ තමයි ඉතින්.<br><br>**ළිදේ තමයි ඔක්කොම ?**<br><br>ඔව්.<br><br>**අරගෙන ගිහිල්ලා හෝදනවා කවද්ද ඒක කරන්නේ සෙනසුරාදා ඉරිදා ?**<br><br>ඔව්.<br><br>**අනිත් දවස්වල අමාරු ඇති නේද කරගන්න ?** |

| | |
|---|---|
| | ඔව්. දැන් ඉරිදා වගේ දවස්වලට මේ කට්ටියට නිවාඩුවක් එහෙම හම්බවුණොත් රෙදි එදාට තමයි අපි ඔක්කෝම අරන් ගිහිල්ලා උදේට පාන්දර හය හත වෙන කොට ඔක්කොම හෝදලා වේල ගන්න තියෙන්නේ. ඊට කලින් නිඩාඩුවක් නෑනේ අපිට හවස මේ වෙලාවට ඇවිත් හෝද ගන්න වෙලාවක් නෑනේ ඉතින්. මේ වෙලාවට හෝද ගන්න පුලුවන් අපි ඇදන් ඉන්න ඇඳුම් ටික විතරයි හෝදලා නාගෙන එන්න වෙලා තියෙන්නේ.<br><br>**ඉතුරු කිරීම එහෙම කොහොමද ? බැංකු පොත් තියෙනවද ?** |
| 13.0 - 14.0 | දැන් අලුතින් තමයි.... කලින්නම් බැංකුවල දාගෙන ආවා සල්ලි මේ ඉයේ පෙරේදා තමයි දැන් වත්තෙන් හදලා තියනවා දැන් ලබන මාසේ ඉදලා තමයි වත්තෙන් කපන්නේ පඩියෙන්.<br><br>**බැංකු පොතකට දාන්න ?**<br><br>ඔක්කොම හරි ගස්සලා දුන්නා ඒවා. ලබන මාසේ මේ මාසේ පලවෙනිදනේ හදලා දුන්නේ. දැන් ලබන මාසේ පඩියට තමයි කපනවයි කියලා කිව්වේ.<br><br>**ඉතින් වතුවල සාමාන්‍යයෙන්........ වත්තේ සාමාන්‍යයෙන් ......... තනියම යන්න එහෙම බය නැද්ද රෑට ?**<br><br>එහෙම නෑ.<br><br>**කිසිම ප්‍රශ්නයක් නෑ. ගෑණු ළමයින්ට එහෙම තනියම යන්න පුලුවන් ?**<br><br>ඔව්<br><br>**පිට ගම්කාරයෝ එනවද වත්තට ?**<br><br>නෑ<br><br>**ආවොත් කවුරුහරි ආවොත් දකිනවා ?**<br><br>මේ පැත්තේ ඇවිල්ලා මෙහෙමයි.... අපේ ගමේ මිනිස්සුයි මේ පැත්තේ ඉතින් ඔක්කොම දන්න කට්ටිය ඉන්නේ. අපිට කිසි ප්‍රශ්නයක් නෑ. අපිට කරදරයක් නෑ. කවුරුත් අදටත් අපිත් එක්ක හොදට ඉන්නේ ඒගොල්ලෝ ඔක්කොම එක සහෝදරයෝ වගේ තමයි කවුරුත් ඉන්නේ. |
| 14.0 -15.0 | **එතකොට දැන් ප්‍රශ්න තියන කාලේ යුද්ද කාලේ එක්කෝ අසූ තුනේ එහෙම මතකද මොනවගේද කියලා එතකොට කරදර තිබ්බ ද මාතර දිස්ත්‍රික්කයේ?**<br><br>කොහොමද දන්නේ නෑ එච්චරනම් මට කියන්න තේරෙන්නේ නෑ.<br><br>**යුද්ද කාලේ ?**<br><br>මේ පැත්තේ නෑනේ.<br><br>**ප්‍රශ්නයක් නෑ? එතකොට වෙන කොහේහරි යුද්දයක් තිබ්බත් ඔයගොල්ලන්ට දෙමළ වුණත් කරදරයක් නෑ ?**<br><br>ඔව්<br><br>**නැද්ද ? ඔයගොල්ලන්ට බයක් එහෙම හිතුන ද ?**<br><br>බය නම් තිබුණා. ඉතින් ඒ වුණාට මොකක්වත් අපිටනම් වෙනසක් වුණේ නෑ. අර එකපාරක් අර ජෙවිපි කලබල දවස්වල තමයි අපේ අම්මලා තාත්තලා උප්පැන්න අරව |

| | |
|---|---|
| | මේවා ඔක්කොම දමලා කොහෙද ඉන්න කොට දාලා ඇවිල්ලා ඒකෙන් තමයි අපිට ගොඩක් අඩුපාඩු තිබුණේ. පස්සේ මම ඒවා ඉතින් හදලා ගත්තා ආපහු අලුතින්.<br><br>**කොයි කාලෙද ?**<br><br>අසූ ගණන් වල ඔය ජෙවිපි කාලේ<br><br>**අසූ අටේ අසූ නවයේ ?**<br><br>ඒවගේ<br><br>**කාලේ ?**<br><br>කලබල තිබුණේ.<br><br>**ඔව්**<br><br>ඔන්න එතකොට ඒගොල්ලෝ මොකක්ද කරලා තියෙන්නේ බඩු මුට්ටු සේරම දාලා ළමයින්ගේ උප්පැන්න ළමයින්ගේ කියන්නේ දෙන්නෙක්ගේ තුන්දෙනෙක්ගේ වගේ ඔක්කොම දාලා ඇවිල්ලා තිබුණේ. ඊට පස්සේ මගේ උප්පැන්න තමයි නැති වෙලා තිබුණේ. ඊට පස්සේ මම ගිහිල්ලා අරන් ඇවිල්ලා තමයි අයිඩින්ටි හදන්න ලියලා ඔක්කොම කරලා තියෙන්නේ තාම ආවේ නැහැ අයිඩින්ටි එක.<br><br>**ඉතින් ඒවා ආමාරුද හදා ගන්න දවසින් කරගන්න පුලුවන් ද උප්පැන්න හදා ගන්න එක අරව මේවා ?**<br><br>මම මේ ෆෝම් එකක් පුරවගෙන පිටබැද්දර ගියා. පිටබැද්දර ගිහිල්ලා තමයි එහෙන් තමයි ගත්තේ උප්පැන්නේ. ඒ ෆෝම් එක බලලා ඒගොල්ලන් ඒපාර උප්පැන්න තියනවයි කියලා අරන් දුන්නා. පස්සේ ඒක ඇවිල්ලා ඊට පස්සේ තමයි මම අයිඩින්ටිය හදන්න දීලා මාස දෙකක් වෙනවා.<br><br>**ඉතින් දැන් සාමාන්‍යයෙන්....... ඔයා කිව්වේ පොඩ්ඩක් බයක් එහෙම ඇති වෙනවා කියලා මොනවගේ බයක්ද ඇති වුණේ ?**<br><br>බයක් කියන්නේ ඉතින් අපිටත් මොකක්හරි කදරයක් වෙයිද අපිට මොනවහරි වුණත් කමක් නැහැ ළමයි ටික මොකක්ද කර ගන්නේ කියලා ඒවා තමයි ඉතින් අපිට වැඩිම දුක.<br><br>**හැබැයි මොනවත් ප්‍රශ්නයක් වුණේ නෑ නේ ද ?**<br><br>මුකුත් ප්‍රශ්නයක් වුණේ නෑ. අපිට ඉතින්<br><br>**එහේ මෙහේ ගියාද යුද්දේ කාලේ ?**<br><br>නෑ. කොහෙවත් ගියේ නෑ.<br><br>**මෙහෙමම හිටියා ?**<br><br>ඔව් |
| 16.0- 17.0 | **හරි හරි එතකොට ඔයා........ ළමයින්ගේ ගැන එහෙම මොනවද තියෙන බලාපොරොත්තු ?**<br><br>ළමයි ඉතින් මොකක්ද ඉතින් බලාපොරොත්තුව ඒගොල්ලෝ හොඳින් ඉන්න ඕන. ඒගොල්ලෝ හොදට ඉගෙනගෙන හොද තැනකට යන්න ඕන කියලා තමයි මගේ අදහස.<br><br>**හොද තැනකට යන්න ඕනෙයි කියන්නේ වත්තෙන් පිට ද ? වත්තෙ ද ?** |

| | |
|---|---|
| | වත්තෙන් හරි වත්තේ ඉදගෙන හරි ඒගොල්ලෝ හොදට රස්සාවක් කරගෙන ඒගොල්ලෝ හොදින් ඉන්න ඕනෙයි කියලා. ලොකු පුතාත් ඒ වගේ තමයි මම හිතන් හිටියේ. එයත් දැන් රට යන්නෙයි කියලා අදහසක් එයාගේ තියනවා. දැන් මේ අවුරුද්දේ අන්තිම වගේ යන්නෙයි කියලා ඉන්නේ.<br><br>**කොහෙද යන්න බලාපොරොත්තු වෙන්නේ ?**<br><br>තාම නෑ ස්ථිර තීරණයක්.<br><br>**මොනව කරන්න ද ?**<br><br>රට යන්න ඕනෙයි කිය කිය හිටියා. ඊට පස්සේ මොකක් කරයිද දන්නේ නෑ. කිව්වා යනවයි කියලා මාත් එක්ක ගිය මාසේ ආපු වෙලාවේ. මම කිව්වා හොදයි එහෙනම් ගිහිල්ලා ඔයගොල්ලෝ හොදින් ඉන්න මට නම් ලොකු දෙයක් කියලා. මොකද අපි නෙමෙයි ඉස්සරහට ජීවත් වෙන්නේ ඒගොල්ලන්නේ කියලා.<br><br>**ඔව් ඔව්.**<br><br>මම කිව්වා ඔයගොල්ලෝ හොදින් හිටියොත් තමයි මල්ලිටත් හොදෙයි කියලා.<br><br>**ඔව්.** |
| 17.0 - 18.0 | ඇයි ඉතින් එක්කෙනයි ඉන්නේ මට ඉතින් එක්කෙනෙක් ලෙඩෙක් ඉන්නේ ඒකයි බය.<br><br>**ඇයි ලෙඩක් කිව්වේ ?**<br><br>ලෙඩයි කියන්නේ පොඩි කාලෙම අවුරුදු පහෙන් වගේ බඩේ ඔපරේෂන් එකක් කරා. ඊට පස්සේ දැන් ඉස්කෝලෙදි ගහගෙන ළමයි ඊට පස්සේ ඇහැට ගලක් වැදිලා ඒකෙන් ඇහැ මේ වුණා. ඊට පස්සේ ඇහැ ඔපරේෂන් කරලා තියෙන්නේ. මාස ගාණක් කරාපිටියේ එක්කන් ගියා මම. එක්කන් ගිහිල්ලා ඊට පස්සේ ඔපරේෂන් එකක් කරලා තමයි දැන් ඇහැ සනීප කරලා තියෙන්නේ. ඒක<br><br>**දැන් සනීපයි ඇහැ ?**<br><br>ඔව්.<br><br>**ඉතින් එයාට ඒකේ ප්‍රශ්නයක් නැහැ සාමාන්‍යයෙන් ජීවිතේ ගෙනියන්න ඇහේ ප්‍රශ්නේ?**<br><br>ඔව් දැන් එයාට ඇවිල්ලා අපි වගේ මහන්සි වෙලා වැඩක් කරන්න බැහැ. එයාගේ නමට තමයි අපි වැඩිපුර මොනවහරි එකතු කරන්නේ. සල්ලි ද හැමතැනම බැංකුවල එහෙම එයාගේ නමට තමයි වැඩිපුර සල්ලි දාගෙන ඉන්නේ. මොකෝ ඉතින් මෙයාට ඉස්සරහට ලොකු මහන්සියෙන් වැඩ කර ගන්න බෑනේ. තව අවුරුදු විසි දෙකක් විස්සක් වෙන කොට දැනටත් එහෙම වැඩ කරාට මොකෝ දවසට දවස් විස්සයි විසි එකයි ඔන්න ඔය වගේ තමයි වැඩ කරන්නේ. මම ඉතින් මුකුත් කියන්නේ නෑ. කෑ ගහනවා. වැඩිය බල කරන්නේ නෑ එයාට යන්නෙයි කියලා. අන්න අදත් ගෙදර තමයි. අද දෙනියායේ ගිහිල්ලා තාම ආවේ නෑ ගෙදර. |
| 18.0 - 19.0 | **ඉතින් මේ......... වත්තේ සාමාන්‍යයෙන්......... ඔක්කොම එකතු වෙලා එකමුතුවට ඉන්නේ ?**<br><br>ඔව්.<br><br>**ප්‍රශ්න මොනවත් නෑ ?**<br><br>නෑ |

| | |
|---|---|
| | **එක්කෙනෙක්ගෙවත් ?**<br><br>නෑ. වැඩපොලට ගියත් කවුරුත් එකට තමයි වැඩ කරන්නේ එන්නෙත් ඔක්කොම එකට තමයි.<br><br>**ගමක් වගේ ?**<br><br>ඔව්. තේ බොන්න ගියත් කවුරුත් එකට වාඩි වෙලා තමයි තේ බොන්නේ. තනි තනියෙන් ගෙනල්ලා එක එක්කෙනා තැන් තැන්වල ඉන්නේ නෑ. ඔක්කොම එක ළග ඉදන් වාඩි වෙලා තේ බොනවා. එයා ගෙනියන ඒවා මම කනවා. මම ගෙනියන ඒවා ඒගොල්ලෝ කනවා. ඒ වගේ තමයි ඉන්නේ. කිසි බේදයක් නැතුව ඔක්කොම හොදට ඉන්නවා.<br><br>**හා. එතකොට දැන් මෙතන ඔක්කොම වැඩ කරන්නේ දෙමළ කට්ටියද සිංහල කට්ටිය ද ?**<br><br>ගොඩක් ඉන්නේ දෙමළ කට්ටිය තමයි.<br><br>**සමහර සිංහල කට්ටියත් ඉන්නවා ?**<br><br>එක්කෙනයි ඉන්නේ ...... පිටින් ඉන්නේ එයා විතරයි ...... අනිත් ඔක්කොම ඉන්නේ දෙමළ කට්ටිය අපේ කට්ටිය තමයි. |
| 19.0 - 20.0 | **එතකොට දැන් මේ පළාතේ........ ඒ කියන්නේ ඔයාගේ ජීවිත කාලය තුළ වුණත් සිහිවටනයක් හැටියට මොනවද තියෙන්නේ ඒ කියන්නේ මොනවහරි වෙලා තියනවද සිද්ධියක් වෙලා තියනවද ? එහෙම නැත්නම් හොද දේවල් වෙලා තියනවද ? නැත්නම් ඒ කියන්නේ ගං වතුරක් හරි ඒ වගේ දෙයක් වෙලා තියනවද ? ඒ කියන්නේ ජීවිත කාලය තුළ මතකයට එකතු කරන්න පුලුවන දෙයක් ?**<br><br>ගං වතුර නම් තිබුණා දෙදහස් ගණන්වල වගේ ගං වතුරක් ආවා ඒකට අපි ටිකක් මේ වුණා. අපේ බඩුමුට්ටු සේරම ගිහිල්ලා අපි ඊට පස්සේ තමයි ටිකක් ආමාරුවෙන් තමයි දැන් ගොඩ ආවේ. ........ ළමයින්ගේ ඇදුම් පවා ඔක්කොම මොනවක්වත් නැති වුණා.<br><br>**කොයි කාලෙද ඒ ?** |
| 20.0 - 21.0 | දෙදහස් තුනේ ද .......<br><br>**ඒක මේ වත්තෙ ද ?**<br><br>නෑ. මේ වත්තේ නෙමෙයි. වෙන වත්තක.<br><br>**ඒ කොහ ද ?**<br><br>මෙතන ඉස්පිරිතාලෙට පොඩ්ඩක් මෙහා තියනවා වත්තක් ඒකේ. ෆැක්ට්‍රියක් හදපු එකක් ඒක කඩන් ගිහින්.<br><br>**ආ**<br><br>ඉස්පිරිතාලෙට පොඩ්ඩක් අන්දිරිපාන හන්දිය කියන්නේ එතන ඒ හරියේ තමයි. එතනින් තමයි අපි පොඩ්ඩක් ......<br><br>**එතකොට ඒ කාලේ එහේ තමයි පදිංචි වෙලා හිටියේ ?**<br><br>ඔව්<br><br>**කොච්චර කල් හිටියද ?** |

| | |
|---|---|
| | එහේ අවුරුදු පහක් හිටියා. ඊට පස්සේ ඒ වත්තෙන් අපිට කිසිම සහනයක් හම්බ වුණේ නෑ. ඊට පස්සේ අපි ආවා. ඇවිල්ලා තමයි ඊට පස්සේ දැන් මේ පැත්තට ඇවිල්ලා ඉදලා ඉතින් අපි ආපහු ජීවිතේ මේව කර ගත්තේ කොහොම හරි.<br>**දැන් සමහර වෙලාවට කරදර තියනවා කියලා කතා කරොත් ඕන නම් ඉන්න නැත්නම් යන්න කියනව කියලා කවදාවත් හිතුනේ නැද්ද ගිහිල්ලා වෙන තැනක පදිංචි වෙන්න ජීවිතේ පටන් ගන්න වෙන විදියකින් ?**<br>නෑ |
| 21.0 - 22.0 | **මේ වත්තත් ප්‍රයිවට් එක්කෙනෙක්ට අයිතිද ?**<br>ඔව්<br>**කාටද අයිති ?**<br>සුදු මහත්තයට.<br>**එයාට ඒ වත්ත විතරද අයිති ?**<br>නෑ එයාට තියනවා වතු ගාණක් තියනවා. රත්නපුරේ බටුවන්ගල ඒ ෆැක්ට්‍රිය නෙලුව පාරේ තියෙන්නේ ඒක.<br>**සුදු මහත්තයෙක් ද ? සුද්දෙක් ද ?**<br>නෑ. එයාට කියන්නේ එහෙම ඒ නම. වෙන නමක් තියෙන්නේ. ඔක්කොම කතා කරලා කියන්නේ<br>**හා හා කියන්නේ සුදු මහත්තයා කියලා. ඇයි සුදු මහත්තයා කියලා කියන්නේ දන්නේ නෑ සුදු ද එයා ?**<br>නැහැ. එයාට පොඩි කාලේ ඉදලම සුදු මහත්තයා සුදු මහත්තයා කියලා ගෙදර කට්ටියත් කියලා තියනවා. දැන් වත්තෙත් ඒ වගේ කවුරුත් කතා කරපු එක ඒක තමයි දැන් එයාගේ නම අපි කියන්නේ. ඒ කියන්නේ ඒ නම කිව්වොත් ඔක්කොම දන්නවා. ලංකාවේ නෙමෙයි පිටරට පවා දන්නවා ඒක දන්නවා ඔය කට්ටිය. දැන් කවුරු ඇහුවත් සුදු මහත්තයා කිව්වම පස්සේ කවුරුත් දන්නවා.<br>**ඉතින් එතකොට එයා ඔයාලගේ ප්‍රශ්න තියන ඒව ගැන ඒ ගැන හොයලා බලන්නේ නැද්ද ඒගොල්ලෝ ?** |
| 22.0- 23.0 | හොයලා බලනවා කියන්නේ දැන් ඒ කට්ටිය එන්නේ නෑ. ඒ කියන්නේ මාස හයකට සැරයක් විතර තමයි එයැයි ලොක්කා එන්නේ. මෙතන ෆැක්ට්‍රියේ ඉන්නේ මල්ලි තමයි වැඩ බලන්නේ. මෙතන ෆැක්ට්‍රියේ ඉන්නේ මල්ලි. අයියා තමයි. අයියගේ වත්ත. මල්ලි තමයි පාලනය ගෙනියන්නේ.<br>**ඉතින් ඒගොල්ලන්ට කියන්න බැරිද ඔය දැන් ඔයා කියපු දුෂ්කරතා ?**<br>කිව්වට ඉතින් ඒගොල්ලෝ අහන්නේ නැනේ. ඒකනේ වෙලා තියෙන්නේ.<br>**එතකොට මේ ඔයගොල්ලන්ගේ මේ ගේ ඔයගොල්ලන්ටම කියලා**<br>නෑ<br>**අයිති නෑ ?**<br>නෑ. ඒගොල්ලෝ යන්න කියන වෙලාවට අපි යන්න ඕන බඩු ටික අරගෙන.<br>**එතකොට ඔයගොල්ලෝ මේ වත්තේ වැඩ කරනකන් මේ ගේ දෙනවා** |

| | |
|---|---|
| | ඔව් ඉන්න. අපි දැන් මෙතනින් යන්නෙයි කිව්වොත් අපි අපේ බඩු ටික අරගෙන අපිට යන්න තමා තියෙන්නේ වෙන කොහාට හරි.<br><br>**මේක මේ ගේ හදලා මේක පිටිපස්ස මේ ඔක්කොම හදලා තියෙන්නේ ඔයගොල්ලෝ හදල තියනවද එහෙම නැත්නම් ?**<br><br>නෑ නෑ.  මෙතනින් මේ අර දොර තියෙන්නේ එතනින් මෙහෙ තමයි ඒගොල්ලෝ හදලා තිබුණේ. අපි වෙනම මැටි වලින් හදා ගත්තා කුස්සිය කාමරය ඉඩ මදි නිසා. ඒක අපි අපේ මහන්සියෙන් හදා ගත්තේ. |
| 23.0 - 24.0 | **ඔයා මේ බංගලාවේ හිටපු කාලේ මොන වගේ ද ?**<br><br>බංගලාවේ හිටපු කාලේනම් ඉතින් එච්චර මට දැනුමක් නැහැ ඉතින්. මම ඒ තරම් හොදින් බලා ගත්තා. එහේ හොදට හිටියා මම. ඊට පස්සේ දෙමව්පියන්ගේ කරදර නිසා තමයි මම ආවේ ? නැත්නම් අදටත් මම එහේ තමයි.<br><br>**ඔයා එහේ ඉන්න කැමතිද ඒ කාලේ ?**<br><br>ඔව්.<br><br>**පොඩි කාලේ ?**<br><br>අම්මල තාත්තලා වගේ අම්මලා තාත්තලා පොඩි කාලෙම ගිහින් නැවැත්තුවට පස්සේ ඒගොල්ලෝ තමයි අම්මයි තාත්තයි කියලා මාව හොදට බලා ගත්තේ. මට කිසි වෙනසක් තිබුනේ නැහැ. ඒකේ මට ඉතින් මම කැමති වුණේ නෑ. මට ආපහු මෙහොට එන්න ඕනෙයි කියලා. ඒගොල්ලෝ කිව්වා ඉතින් අපි ඉන්නකන් ඒගොල්ලෝ ඉන්නකන් බලා ගන්නන් ඊට පස්සේ මටම කියලා ගෙයක් හදලා දීලා ඔක්කොම මේව කරලා දෙන්නම් කියලා. තාත්තයි කරදරේ හින්දා තමයි මම ආවේ. පොලිසි යනවයි අරකයි මේකයි කියපු නිසා.<br><br>**බොහොම ස්තුතියි කතා කරාට. අපි ගිහිල්ලා එන්නම්.**<br><br>හොදයි.<br><br>**බොහොම ස්තුතියි.** |